# සපත්තුව



සිබිල් වෙත්තසිංහ

සුපුන් ඉස්කෝලෙ යන්න
සපත්තු දාගන්න බැලුවා.



සපත්තුවක් ඇතුළෙ මීයෙක් නිදි.



සුපුන් ඉස්කෝලෙ ගියේ
සපත්තු නැතුව.



“කෝ සපත්තු?” ටීචර් ඇහුවා.



“සපත්තුවක් ඇතුළෙ මීයෙක් නිදි. මම එයාව කීද්දුවෙ නෑ.”



ළමයි හිනා වුණා.



ටීචර් හිනා වුණේ නෑ.



“සතුන්ට ආදරේ වෙන එක හොඳයි. සුපුන් කරුණාවන්ත ළමයෙක්” ටීචර් කිව්වා.

